Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සති පාසල

විෂය:- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සතිය :

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

(1) රජයක් ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මක් දැක්වීමට බලපාන අරමුණ වන්නෙ,

(1) පාරිභෝගිකයන් සුරක්ෂිත වන ලෙස ව්‍යාපාරයක් පවත්වා ගන්නෙද යන්න.

(2) සමාජයට ව්‍යාපාරයෙන් වන සේවාව පිළිබඳ අවධානය යොමු කිරීම.

(3) ණය හා වෙනත් සේවාවන් සැපයීම.

(4) සාධාරණ මිල.

(2) රජයක් ව්‍යාපාරවල මැදිහත් වන්නෙ,

(1) ව්‍යාපාර අරක්ෂා කර ගැනීම.

(2) සමාජය ආරක්ෂා කර ගැනීම

(3) ව්‍යාපාර හා සමාජය ආරක්ෂා කර ගැනීම

(4) රජයට අදායම් ලබා ගැනීමට.

(3) ව්‍යාපාර පරිසර අධ්‍යයනයේ දී රජයේ බලපෑම වැදගත් වේ.පහත සඳහන් සාධක අතරින් රජයේ බලපෑමක් නොවන්නේ,

(1)යටිතල පහසුකම් සැපයීම.

(2) පාරිභෝගික ආරක්ෂාව සුරක්ෂිත කිරීම

(3) ව්‍යාපාර ලියාපදිංචිය හා බලපත්‍ර දීම.

(4) සේවකයින් බඳවා ගැනීම.

(4) ප්‍රජා පරිසරය නියොජනය කරන සාධකයක් නොවන්නේ,

(1) ස්ත්‍රී පුරුෂ භාවය.

(2) වයස් ව්‍යුහය

(3) සිරිත් විරිත්

(4) ජනගහන වර්ධනය.

(5) ආර්ථික පරිසරය නියොජනය කරන සාධකයක් නොවන්නේ,

(1) පොලී අනුපාතය.

(2) ආදායම් බෙදී යාම

(3) ජනගහනයේ වයස් ව්‍යුහය.

(4) දළ ජාතික නිෂ්පාදිනය.